# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1637/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 25/10/2024<br>පැය 1505 |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**නාරාහේන්පිට පොලිස් රෝහලේ නවීකරණය කරන ලද වාට්ටු අංක 01 විවෘත කිරීම.**

පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය විසින් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන්ගේ සුභ සාධනය වෙනුවෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග වල දෙවන පියවර වශයෙන් නාරාහේන්පිට පොලිස් රෝහලේ වාට්ටු අංක 01 පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ මූල්‍ය අනුග්‍රහකත්වයෙන් නවීකරණය කිරීමෙන් අනතුරුව නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නා කාන්තා පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීනියන්ගේ පරිහරණය වෙනුවෙන් භාර දීමේ උත්සවය වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාගේ **ප්‍රධානත්වයෙන් 2024 ඔක්තෝම්බර් මස 25 වන අද දින උදෑසන 08.30 ට නාරාහේන්පිට පොලිස් රෝහල් පරිශ්‍රයේදී** පැවැත්විය.

මෙම නවීකරණය කරන ලද වාට්ටු අංක 01 පරිශ්‍රය කාමර 05කින් සමන්විත වන අතර වායුසමනය කර කාමර සඳහා වෙන වෙන් වශයෙන් ශීතකරණ, කෑම මේස, ඩයලොග් ටීවී පහසුකම් ඇතුළු සියලු සනීපාරක්ෂක අංග වලින් සමන්විතව නිර්මාණය කර ඇත. පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය විසින් මුදල් රුපියල් ලක්ෂ 50 කට ආසන්න මුදලක් වැය කර මෙම නවීකරණය කිරීම් කටයුතු සිදු කර ඇත.

**මෙම අවස්ථාවට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහයක සේවා රාජිත ශ්‍රී දමින්ද මහතා, ඇතුළු පොලිසියේ උසස් නිලධාරීන් රැසක් සහභාගී විය.**









පොලිස් මාධ්‍ය කොට්ඨාසය.